PR/2019/… S

# ජපන් තානාපති කාර්යාලය


**නො.20 ශ්‍රීමත් ආර්.පී.සේනානායක මාවත, කොළඹ 07**

දුරකථනය: 94-11-269-3831~3, ෆැක්ස්: 94-11-269-8629

ඊ-මේල්: cultujpn@co.mofa.go.jp


ජූලි 17, 2019

## පුවත්පත් නිවේදනය

**මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ශිෂ්‍යත්ව ව්‍යාපෘතියට ජපානයෙන් රුපියල් මිලියන 429 ක අධාර ප්‍රදානයක්.**

ජපන් රජය මගින් රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 429 ක අධාර ප්‍රදානයක් මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇත.

රාජ්‍ය සේවයේ නියුතු විධායක ශ්‍රේණියේ තරුණ නිලධාරීන්, අනාගතයේ අදාල ක්ෂේත්‍රයන්හි නායකත්වය දැරීමට සුදුසු වන පරිදි ඔවුන්ගේ පරිපාලන කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ජපන් විශ්ව විද්‍යාලයන්හි අධ්‍යාපනය ලබා දීමට ජපන් යෙන් මිලියන 263 ක (දළ වශයෙන් රුපියල් මිලියන 429 ක) මෙම ප්‍රදානය භාවිතා කෙරේ. මේ යටතේ වසර 2020 සිට 2022 දක්වා රාජ්‍ය අංශයේ නිලධාරීන් 17ත් දෙනෙකු සඳහා දෑ අවුරුදු පශ්චාත් උපාධි පාඨමාලා හෝ ආචාර්ය උපාධි හැදෑරීමට අවස්ථාව සලසා දී ඇත.

රාජ්‍ය ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර කළමනාකරණය, පරිසර කළමනාකරණය, ආපදා කළමනාකරණය සහ දේශගුණික විපර්යාස අධ්‍යයන යනාදී ක්ෂේත්‍ර මෙම පශ්චාත් උපාධි පාඨමාලා මගින් ආවරණය වේ. මෙම වැඩසටහන ආරම්භ වූ 2010 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය අංශයේ නිලධාරීන් 137 දෙනෙක් උදෙසා මෙමගින් ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඇත.

මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා දෙරට අතර හුවමාරු පත්‍ර අත්සන් කිරීම 2019 ජූලි 17 වෙනි දින මුදල් අමාත්‍යංශයේදී ශ්‍රී ලංකාවේ ජපන් තානාපති අකිරා සුගියාමා මහතා සහ මුදල් අමාත්‍යංශයේ ලේකම් ආර්. එච්. එස්. සමරතුංග මහතා විසින් සිදුකරනු ලැබිය.(නිමි)

*************************************************************

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න.
සංවර්ධන සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය
දුරකථනය 011-2693831-3 (දිගු අංකය 226)